විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்
PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරියඉல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரியNo.628,10th Floor,Jana Jaya City Building,Nawala Road,Rajagiriya

| මගේ අංකය / எனது இல. / My Ref. | WPC/PSC/REC/04/1 (i) | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2024.07.25 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාත.

<u>අයදුම්පත් කැඳවීමේ දින දීර්ඝ කිරීම.</u>

පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාග සඳහා අයදුම්පත් කැඳවීමේ දින දීර්ඝ කිරීමට තීරණය කර ඇත. ඒ අනුව අයදුම්පත් කැඳවීමේ අවසන් වන දිනය 2024.08.15 වේ. මේ වන විටත් ඉහත තනතුර සඳහා අයදුම්කිරීමට නොහැකි වූ අයදුම්කරුවන්හට 2024.08.15 දින දක්වා අයදුම් කිරීමට හැකියාව පවතී. එසේම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සලකා බැලීමේ අවසන් දිනය නොවෙනස්ව පවතී.

02. අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පළ කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

i) බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය, පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) සහ පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා) සඳහා වන සීමිත බඳවා ගැනීම – 2024

ii) බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී තනතුර III ශ්‍රේණිය සඳහා වන සීමිත බඳවා ගැනීම – 2024

03. මේ සම්බන්ධයෙන් ඔබගේ කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් සහ ඔබ යටතේ කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන් කඩිනමින් දැනුවත් කිරීමට කටයුතු කරන්නේ නම් මැනවි.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

දු.ක. - 011 2879614
ෆැක්ස් - 011 2879512
ඊ-මේල් - ppscwprec@sltnet.lk

පිටපත්:-

01. ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.) - අ.ක.ස.
02. ලේකම්, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.) - අ.ක.ස.
03. ලේකම්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.) - අ.ක.ස.
04. ලේකම්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප.) - අ.ක.ස.
05. ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය (බ.ප.) - අ.ක.ස.


| ලේකම් / செயலாளர் / Secretary | සහකාර ලේකම් (කළමනාකරණ හා ප්‍රතිපත්ති) / உதவிச் செயலாளர் (நிர்வாகம் மற்றும் கொள்கைகள்) / Assistant Secretary (Management & Policies) | සහකාර ලේකම් (විභාග හා බඳවාගැනීම්) / உதவிச் செயலாளர் (பரீட்சைகள் மற்றும் ஆட்சேர்ப்பு) / Assistant Secretary (Examinations & Recruitment) | සහකාර ලේකම් (ආයතන හා ගිණුම්) / உதவிச் செயலாளர் (தாபனம் மற்றும் நிதி) / Assistant Secretary (Establishment & Accounts) | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer | කාර්යාලය / அலுவலகம் / Office: 011 2879614 |
|---|---|---|---|---|---|
| 011 2879528 | 011 2879610 | 011 2879317 | 011 2879538 | 011 2879517 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2879512; ඊ-මේල් / மின்னஞ்சல் / E-Mail: ppscwpse@sltnet.lk |

## බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී තනතුර III ශ්‍රේණිය සඳහා වන සීමිත බඳවා ගැනීම – 2024

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී III ශ්‍රේණියේ තනතුරට අදාළ පුරප්පාඩු පිරවීම සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි MN 03 – 2016 අනුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී III ශ්‍රේණියට හිමි මාසික වැටුප් පරිමාණය රු.31,040-10x445-11x660-10x730-10x750-57550/- වේ. එම චක්‍රලේඛයේ උපලේඛණ II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**03.** සේවා කොන්දේසි

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

(ii) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

(iii) තනතුරට බඳවා ගැනීමෙන් පසු බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ දැක්වෙන ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාග වලින් සමත් විය යුතුය.

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයද, බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි වලට නොහොත් නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලට ද අනුව කටයුතු කළ යුතුය.

04. පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී III ශ්‍රේණියේ තනතුරේ පුරප්පාඩු 04 ක් සඳහා බඳවා ගැනීම සිදු කරයි. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2024.07.15 දින වේ. අයදුම්කරන තනතුරට අදාල සියලු සුදුසුකම් 2024.07.15 දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

**05.** සුදුසුකම්

**5.1 අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාව යටතේ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයන් අතුරින් විෂයන් තුනකින් එකවර සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

**5.2 වෘත්තීය සුදුසුකම්**

I. කුණ්ඩසාලේ, අගුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය, කරපිංච, පාලමුණේ, නයිවල, පරන්තන් යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

II. අම්පාර හාඩි කාර්මික ආයතනයෙන් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

III. ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

IV. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.

හෝ

V. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

VI. ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.3 කායික සුදුසුකම්

සෑම අයදුම්කරුවෙක්ම බස්නාහිර පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

5.4 වෙනත් සුදුසුකම්

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් අවම වශයෙන් වසර 03 ක වත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

iii. මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මෙම නිවේදනයේ සඳහන් සියළුම සුදුසුකම් 2024.07.15 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු අතර යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

06. වයස් සීමාව : දැනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අතරින් අයදුම්පත් කඳවන බැවින් වයස් සීමාව අදාළ නොවේ.

07. විභාගය පිළිබඳ විස්තර

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

08. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය සහ තර්කන ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ලබන බහුවර්ණ ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂි කර්මාන්තයේ දායකත්වය<br>ආ) දළ ජාතික නිෂ්පාදනයට කෘෂි කර්මාන්තයේ දායකත්වය<br>ආ) රැකියා නියුක්තිය<br>ඇ) කෘෂි කර්මාන්තයේ අපනයන ආනයන තත්වය |
| | 2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම |
| | 3. පස සහ ශාක පෝෂණය<br>අ) පසේ ව්‍යුහය වයනය, භෞතික හා රසායනික ලවණතාවය භෝග වගාව කෙරෙහි එහි බලපෑම.<br>ආ) ශාක පෝෂණය පාංශු/ ශාක පෝෂණ කළමනාකරණය<br>ඇ) පැලෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු |
| | 4. පාංශු රසායන පාංශු රක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම |
| | 5. වාරිමාර්ග ක්‍රම හා ජල කළමනාකරණය<br>අ) විවිධ බෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය.<br>ආ) ක්ෂුද්‍ර ජල කළමනාකරණ ක්‍රම<br>ඇ) ජල වහනය හා එහි වැදගත්කම |
| | 6. ගොවිපල යාන්ත්‍රීකරණය<br>අ) ගොවිපල යාන්ත්‍රීකරණයේ වාසි අවාසි<br>ආ) බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්තෝපකරණ<br>ඇ) ජල සම්පාදන හා පැලෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ<br>ඈ) ඉහත යන්ත්‍ර ක්‍රියා කරවීම හා නඩත්තුව |
| | |

| | |
|---|---|
| | 7. කෘෂිකාර්මික ව්‍යාප්තිය<br>අ) කෘෂිකාර්මික ව්‍යාපෘති උපාය මාර්ග හා ක්‍රමවේදය<br>ආ) කෘෂිකාර්මික ව්‍යාපෘති සන්නිවේදන ක්‍රම |
| | 8. පටක රෝපණය<br>අ) පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම<br>ආ) පටක රෝපණයේ භාවිතයන්/ යෙදීම් උදාහරණ<br>ඇ) පටක රෝපණයේ වාසි හා අවාසි |
| | 9. පැලෑටි නිරෝධායන පිළිබඳ දැනුම<br>අ) පැලෑටි නිරෝධායන රෙගුලාසි පිළිබඳ දැනුම<br>ආ) පැලෑටි නිරෝධායන ක්‍රම |
| | 10. ශාක සංරක්ෂණය<br>අ) ශාක සංරක්ෂණයේ වැදගත්කම (ශාක/ ජාන ප්ලාස්ම)<br>ආ) ශාක සංරක්ෂණයේ ක්‍රම (ශාක/ ජාන ප්ලාස්ම) |
| | 11. ජාන තාක්ෂණය<br>අ) DNA වල වැදගත්කම<br>ආ) ජානය යනු කවරෙක්ද? එහි ක්‍රියාකාරිත්වය<br>ඇ) DNA තාක්ෂණය යොදා ගැනීමේ අවස්ථා<br>ඈ) ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ශාක වැඩිදියුණු කිරීමට ඇති හැකියාව |
| | 12. ශ්‍රී ලංකාවේ ජනපද ව්‍යාපාරය හා මහවැලි ව්‍යාපාරය පිළිබඳ දැනුම<br>අ) ජනපද ව්‍යාපාරය පිහිටුවා ඇති ස්ථාන<br>ආ) මහවැලි ව්‍යාපාරයට අයත් වන ප්‍රදේශ |
| | 13. ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම |
| | 14. සිතියම් ආශ්‍රිත කරුණු පිළිබඳ දැනුම<br>අ) අනිලමානය, රෝඩ් රේසරය, ඩම්පි ලෙවලය, තියෝඩර් ලයිටරය<br>ආ) 1:50,000- 1:10,000 අඟලේ සිතියම හා අවසාන ගම් පිඹුර පිළිබඳ විස්තරය |
| | 15. ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉඩම් පිළිබඳ හා ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු, ආයතන පිළිබඳ දැනුම, ඉඩම් වර්ග<br>රජයේ ඉඩම්, පුද්ගලික ඉඩම්, ප්‍රවේණි ඉඩම් |
| | 16. ඉඩම් සංවර්ධනය හා බෙදාදීම පිළිබඳ දැනුම<br>වර්තමානයේ ඉඩම් සංවර්ධනය හා බෙදාදීම පිළිබඳ ක්‍රියාත්මක ජාතික වැඩසටහන් පිළිබඳ අවබෝධය<br>ඉඩම් නොමැති පුද්ගලයන් හඳුනා ගැනීම<br>බිම් සවිය වැඩසටහන<br>ඉඩම් කැබලි ලක්ෂයේ වැඩසටහන |
| | 17. රජ සමයේ සිට මේ දක්වා ඉඩම් වල අයිතිය බැහැර කිරීමට යොදාගත් ලේඛන පිළිබඳ අවබෝධය<br>අ) සන්නස්, නින්දගම්<br>ආ) බද්දකර, ස්වර්ණ භූමි, ජය භූමි, රත්නභූමි, රන්බිම |

## 9. විභාග ගාස්තු

සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුවේ. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු.1200/= කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම බස්නාහිර පළාත තුල පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබාගන්නා බ.ප.01 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

10. අයදුම් කිරීමේ ක්‍රමය

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිත කරමින් **A4** ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක **01** සිට **03** තෙක් පළමු පිටපටද අංක **04** සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. **අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.**

**(ආ)** සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2024.07.15 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බස්නාහිර පළාත. අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරි **III ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය 2024 (සීමිත)** යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. **අයදුම්පත් ලද බව දන්වනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**(ඇ)** අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් යොමු කරනු ඇත. බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk යන වෙබ් අඩවිය මඟින් ප්‍රවේශ පත්‍ර බාගත කර ගැනීමේ හැකියාව පවතී. එසේම ප්‍රවේශ පත්‍රය නිල වෙබ් අඩවිය මඟින් බාගත කර ගැනීමට නොහැකි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද, ඇතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

**11.** විභාගයට ඇතුල්වීම

a. නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

b. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදු වනු ඇත.

12. අපේක්ෂකයාගේ අනන්‍යතාවය:
තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය

13. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

14. විභාග ක්‍රමය

i. අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්නපත්‍ර වලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.
ii. මෙම විභාගය දන්වනු ලබන ඉදිරි දිනයකදී පවත්වනු ලැබේ.

15. බඳවා ගැනීමේ ක්‍රමය

සුදුසුකම් ලැබීම සඳහා ලිඛිත විභාගයකට පෙනී සිට අවම වශයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% ක් බැගින් ලබාගත යුතුය. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගෙන් මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර තනතුරට බඳවා ගැනීමට අදාළ මූලික සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය සනාථ කර ගැනීමට පමණක් මෙය පවත්වනු ලැබේ.

16. මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

17. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන/ නොවන ඕනෑම කරුණක් පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

18. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරඟ විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩ දෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දි අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

19. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත
2024.**06.** 14

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී තනතුර III ශ්‍රේණිය සඳහා වන සීමිත බඳවා ගැනීම – 2024

විභාග අංකය [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

නිවේදනයේ අංක 1 අනුව ඉල්ලුම්කරන තනතුරට අදාළ ශ්‍රේණිය ..........

(මෙම ශ්‍රේණිය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E

[ ]

01 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -..........
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):
..........
(උදා: H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන්)-..........

1.4 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | | | | ]

02 2.1 ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ..........
..........

2.2 ස්ථිර ලිපිනය(සිංහලෙන්/දෙමළෙන්): ..........
..........

2.3 විභාග ප්‍රවේශපත්‍රය එවිය යුතු ලිපිනය:-
i. සිංහලෙන්/දෙමළෙන්
..........
..........
ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින්:- ..........
..........

2.4 දුරකථන අංකය :

ස්ථාවර: [ | | | | | | | | | | ] ජංගම: [ | | | | | | | | | | ]

❖ විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට **SMS** ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න. (පසුව කරනු ලබන පැමිණිලි භාරගනු නොලැබේ)

03 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

ස්ත්‍රී [ ] පුරුෂ [ ]

3.2 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - කොළඹ -1
ගම්පහ - 2
කළුතර - 3

[ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය-..........

3.4 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව-..........

04 4.1 විවාහක/අවිවාහක බව - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

විවාහක ☐ අවිවාහක ☐

4.2 උපන් දිනය වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

4.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු: ☐☐ මාස: ☐☐ දින: ☐☐

05 අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තරය:

i. විභාගයේ වර්ෂය හා මාසය: වර්ෂය- ☐☐☐☐ මාසය- ☐☐
ii. විභාග අංකය: ....................
iii. ප්‍රතිඵල:

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

5.2 අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳව විස්තරය:

i. විභාගයේ වර්ෂය හා මාසය: වර්ෂය- ☐☐☐☐ මාසය- ☐☐
ii. විභාග අංකය: ....................
iii. ප්‍රතිඵල:

| විෂය | සාමාර්ථය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

06 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 5.2 අනුව ලබා ඇති වෘත්තීය සුදුසුකම්:( නිවේදනයේ සඳහන් වෘත්තීය සුදුසුකම්වලට අදාල අනු අංකය ඉදිරියෙන් සටහන් කරන්න.)

i) ..........................................................................................

ii) ..........................................................................................

07 දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින්නේ නම්,

7.1 දැනට දරණ තනතුර : ..........................................................................................
7.2 සේවා ස්ථානයේ නම සහ ලිපිනය : ..........................................................................................
7.3 එම තනතුරට පත්වීමේ දිනය : ..........................................................................................
7.4 එම තනතුර ස්ථිරද, තාවකාලිකද, අනියම්ද යන්න : ..........................................................................................
7.5 සේවය ස්ථිර කල දිනය : ..........................................................................................

08 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාල කොටුවේ √ ලකුණ යොදන්න) ඔව් ☐ නැත ☐

"ඔව්" නම් විස්තර සඳහන් කරන්න: ..........................................................................................

09 ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ...........................................................................................

විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය - ...........................................................................................

දිනය - ...........................................................................................

| ලදුපත මෙම කොටුව තුල නොගැලවෙන සේ අලවන්න |
|---|

10 අයදුම්කරුගේ සහතිකය

...........................................................................................

........................................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී III ශ්‍රේණියට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය ........................ ................................................

අයදුම්කරුගේ අත්සන

11 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන.................................................................. මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත් , ඔහු/ඇය .................................වැනි දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

................................................

අත්සන සහතික කරන්නාගේ
අත්සන හා නිල මුද්‍රාව

දිනය - ................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම - ................................................
තනතුර - ................................................
ලිපිනය - ................................................

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................... මයා/මිය/මෙනවිය විසින් ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවටත්, දැනට ........................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................................................. වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහුට/ ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවටත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සහතික කරන අතර මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

දිනය - ................................................
සහතික කරන නිලධාරියාගේ නම - ................................................
තනතුර - ................................................
ලිපිනය - ................................................

13. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

ඉහත නිර්දේශය සමඟ එකඟ වෙමි./ නොවෙමි.

................................................ ................................................

දිනය

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන
හා නිල මුද්‍රාව